# වසංගත රෝග හේතු හා එහි ඉතිහාසය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් (ආයුර්වේද ශාස්ත්‍රය ඇසුරෙනි)

**මොල්ලිගොඩ එස් ජී[1]**

**සංක්ෂිප්තය**

වර්තමාන ලෝකය හමුවේ පවතින අභියෝග අතරින් වසංගත රෝග සඳහා හිමි වන්නේ ප්‍රමුඛතම ස්ථානයකි. භෞතික සංවර්ධනය පමණක්ම අරමුණු කර ගත් බටහිර ආර්ථික න්‍යාය තුළට කොටු වී සිටින මානව ප්‍රජාව Covid-19 හමුවේ ලැබූ පරාජය මානව ශිෂ්ඨාචාරයේ දරුණුතම අවස්ථාවක් සේ සැලකිය හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වන්නේ වසංගත රෝග ඉතිහාසය හා ආයුර්වේද ශාස්ත්‍රය තුළ සඳහන් වන වසංගත රෝග හේතු චිකිත්සාව හා රෝග වළක්වා ගැනීම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ආයුර්වේද ශාස්ත්‍රය ලොව ඉතා පැරණි වෛද්‍ය ක්‍රමයකි. එම ශාස්ත්‍රය තුළ චරක සුශ්‍රැත ආදී ග්‍රන්ථවලට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. එම ග්‍රන්ථ මූලික වශයෙන් ඍෂි භාෂිතයෙන් පෝෂණය වූ ග්‍රන්ථ ලෙස සළකනු ලබයි. එම ග්‍රන්ථ සුපරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ වර්ෂ 3000-5000 කට පමණ පෙර කාලවලද වසංගත තත්ව ඇතිවී තිබෙන බවයි. මෙම පරීක්ෂණ කාර්යය සඳහා දත්ත රැස් කරන ලද්දේ මූලික ආයුර්වේද ග්‍රන්ථ වන චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව, අෂ්ටාංගහෘදය සංහිතාව, භාව ප්‍රකාශය, ශාරඞ්ගධර සංහිතාව, මාධව නිදානය, වෙනත් ආයුර්වේද වෛද්‍ය ග්‍රන්ථ හා අන්තර්ජාලයේ සඳහන් පර්යේෂණාත්මක ලිපි ලේඛන ඇසුරෙනි. සුශ්‍රැත සංහිතාවේ සූත්‍ර ස්ථානයේ ඍතු චර්යා අධ්‍යායයේ මෙන්ම චරක සංහිතාවේ විමාන ස්ථානයේ ජනපද උද්ධ්වංශන අධ්‍යායයේ මේ පිළිබඳ බොහෝ කරුණු අන්තර්ගතය. මෙම කරුණු පිළිබඳව විමර්ෂණය කිරීමෙන් පෙනී යන්නේ ජනපද උද්ධ්වංශනය සඳහා හේතු වන සියලු කාරණා ගෝලීය වසංගත ඇති කිරීමටද හේතු වන බවයි. වර්තමානයේ ලෝකය මුහුණ පා තිබෙන Covid වසංගතය මඟින් මිනිසා අවබෝධ කර ගත යුතු ප්‍රධාන කරුණ වන්නේ ස්වාභාවධර්මය විනාශ කිරීම, Covid-19 රෝගයට වඩා බරපතල කාරණයක් වන බවයි.

මූලපද - වසංගත, කොවිඩ්- 19, ආයුර්වේද, චරක, සුශ්‍රැත.

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය, ශ්‍රී ලංකාව.
සම්බන්ධිත කතෘ: ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස් ජී මොල්ලිගොඩ මිය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපැල: susanthamolligoda@gmail.com

## හැඳින්වීම

නූතන වෛද්‍ය විද්‍යාවේ පීතෘවරයා ලෙස සැලකෙන හිපොක්‍රටීස්ගේ වාර්තා අනුව වසංගත පිළිබඳ ඉතිහාසය ක්‍රි.පූ. හතරවන සියවස දක්වා දිවයයි.[1] එම වසංගතය ඉන්ෆ්ලුවැන්සා රෝගය පිළිබඳවයි. එමෙන් ම වසූරිය, කහ උණ, මැලේරියා, ලාදුරු, ටියුබකියුලෝසිස්, සරම්ප, පැපොල, තයිපස් උණ, ටයිෆොයිඩ් උණ ආදී රෝග වසංගත ලෙස සලකා තිබේ.[2] එනමුත් ඒවා ගෝලීය වසංගත වශයෙන් හඳුනාගෙන නොමැති බව ප්‍රකට වන්නේ නාමකරණය, ජනපද මූලික කරගෙන දක්වා තිබීමෙනි. උදාහරණ වශයෙන් චරක සංහිතාවේ සඳහන් ජනපද උධ්වංසනීය අධ්‍යාය දැක්විය හැකිය.[3] පසු කාලීනව මුහුදු මාර්ග හා ගුවන් මාර්ග සංවර්ධනය වීම නිසා මිනිසා ලෝකය පුරා සංචාරය කිරීම හා ලොකයේ විවිධ රටවලට සංක්‍රමණය වීම ආරම්භ විය. එම නිසා මෙම වසංගත ඉතා සීඝ්‍රයෙන් ලෝකය පුරා ව්‍යාප්ත වීම සිදුවිය. තාක්ෂණය සමඟ වේගයෙන් ඉදිරියට දිවයන අප අද අවතීර්ණ වී සිටින්නේ එවැනි පසුබිමකටයි.

## පර්යේෂණයේ අරමුණු

මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ

1. වසංගත රෝග ඉතිහාසය අධ්‍යයනය කිරීම.
2. ආයුර්වේද ශාස්ත්‍රය තුළ සඳහන් වන වසංගත රෝග හේතු, චිකිත්සාව හා රෝග වළක්වා ගැනීම පිළිබඳව අධ්‍යයනය කිරීම.

වසංගත රෝග ඉතිහාසය අධ්‍යයනය කිරීම සහ ආයුර්වේද ශාස්ත්‍රය තුළ සඳහන් වන වසංගත රෝග හේතු, චිකිත්සාව හා රෝග වළක්වා ගැනීම පිළිබඳව අධ්‍යයනය කිරීම වේ.

## වසංගත රෝග පිළිබඳ ඉතිහාසය

සොයා ගෙන ඇති දත්ත අනුව බොහෝ විට මෙම වසංගත බොහෝමයක් ම යුරෝපා මහද්වීපය මුල් කර ගෙන ආරම්භ වී ඇත. ක්‍රි.පූ. 4 වෙනි සියවසේ දී ඇතැන්ස් නගරයේ ඇති වූ Peloponnesian යුද්ධ කාලයේ දී උණසන්නිපාත වසංගතයෙන් ඇති වී තිබේ.[4] 1918 දී ස්පාඤ්ඤය පුරා වසංගතයක් පැතිරී ඇති අතර, එය Spanish flue නමින් හඳුන්වයි.[5] දාහතරවෙනි ශත වර්ෂයේ දී මහද්වීප ගණනාවක් පුරා පැතිරුණු වසූරිය වසංගතය නිසා ලෝක ජනගහනයෙන් මිලියන 20 කට වඩා වැඩි ප්‍රමාණයක් මරණයට පත් වී ඇත.[6] ක්‍රි.ව. මුල් සියවස්වල ඉතාලිය, ඊජිප්තුව වැනි රටවල්වලින් මෙම වසංගත ආරම්භ වූ බවට තොරතුරු හමුවෙයි. 1331 දී යුරෝපයේ ඇති වූ වංසගතයක් නිසා විශාල ජන සංහාරයක් සිදු වී ඇති අතර, එය Black death නමින් හැඳින්වේ. ක්‍රි.ව. 1855 දී චීනයෙන් ආරම්භ වූ වංසගතයක් පිළිබඳ තොරතුරු හමුවෙයි. මෙය හඳුන්වන්නේ Third plaque pandemic යනුවෙනි.[7] ආයුර්වේදයේ ඉපැරණි සංහිතා ග්‍රන්ථවල මෙවැනි වසංගත සඳහා හේතු සාධක දක්වා තිබෙන අතර, එයින් ගම්‍ය වන්නේ මෙම වසංගත, මෙම ග්‍රන්ථ රචනා වීමට පෙර පටන් පැවති බවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම සාහිත්‍ය පර්යේෂණ කාර්ය සඳහා දත්ත රැස් කරන ලද්දේ ආයුර්වේද මූලික ග්‍රන්ථ වන චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව, අෂ්ටාංගහෘදය සංහිතාව, භාව ප්‍රකාශය, සාරඩ්ගධර සංහිතාව, මාධව නිදානය, වෙනත් ආයුර්වේද වෛද්‍ය ග්‍රන්ථ හා අන්තර්ජාලයේ සඳහන් පර්යේෂණාත්මක ලිපි ලේඛන ඇසුරෙනි. විශේෂයෙන්ම අන්තර්ජාලයේ ප්‍රකාශිත වසංගත පිළිබඳ පර්යේෂණ ලිපි පරිශීලනය කරන ලදී

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### ජනපද හෝ ගෝලීය උධ්වංසනයට හේතු

චරක සංහිතාවේ සඳහන් වන පරිදි ජනපද උධ්වංසනයට හෙවත් විනාශයට හේතුවන්නේ එකිනෙකට වෙනස් ප්‍රකෘති ඇති මිනිසුන්ගේ අන්‍ය වූ සමානතා සංඛ්‍යාත වූ භාවයන් වේද ඒ භාවයන් ගේ විගුණත්වය හේතු කොට ගෙන උපදනා සමාන කාලීන වූ ද සමාන ලක්ෂණ ඇත්තා වූ ද රෝග හෝ ජනපද විනාශ කරමින් මිනිසාට මරණය ගෙන දෙන අවස්ථාවන් ය. මිනිසාගේ අසමාන වූ භාවයන් එනම්, මිනිසුන් එකිනෙකට වෙනස් වන දෑ පවතී. එනම් ප්‍රකෘති, ආහාර, දේහ, බල, සාත්ම්‍ය, සත්ව, වයස යන මේවා ය.[8] මෙසේ විවිධ වූ භාව සහිත වුවද සියලු ම මිනිසුන්ට සමානව බලපෑම් ඇති කරන පොදු සාධක පවතී. ඒවා නම් වායුව, ජලය, දේශය, කාලය යන මේවා ය.[9]

කුමන හෝ හේතුවක් නිසා ආශ්වාස ප්‍රශ්වාස සඳහා මූලික වන අප අවට පවතින වාතය දූෂිත වේද මෙය වසංගතයක් නිර්මාණය වීම සඳහා හේතු වෙයි. මෙසේ අනාරෝග්‍යකර වූත් මානවයාට පීඩා ජනක වූත් වාතය හඳුනා ගැනීම පහසු ය. වාතයේ ජල වාෂ්ප ප්‍රමාණය අතිශයින් ඉහළ යාම, සුළඟේ වේගය අසාමාන්‍ය ලෙස වර්ධනය වීම හා එහි ඇති චණ්ඩ ස්වරූපය, සෘතුවලට අනුකූල නොවන අයුරින් පරිසර උෂ්ණත්වය වැඩිවීම හෝ අඩුවීම, වායු ස්කන්ධයක පවතින වායු අනුපාත බෙහෙවින්

වෙනස් වීම, සුළඟ මගින් ඇති කරන ශබ්දයන් ව්‍යාකූලතාවයට පත්වීම යන ලක්ෂණ සහිත වාතය යම් දේශයකට බලපෑම් ඇති කරයි ද, මෙම කරුණු වසංගත ඇති කිරීමට හේතු වේ. එසේම අසාමාන්‍ය වූ ගන්ධ සහිත වාතය, වාතයේ වර්ණය විකෘති වීම, වාතයේ වැලි,[10] පස්, දූවිලි විශාල ප්‍රමාණයක් තිබීම ද වසංගත ඇති කිරීමට මූලික හේතු වෙයි.

එසේම යම් දේශයක පවතින ජලයේ විකෘති ගඳ පවතිද, ජලයේ රසයන් විකෘති වේද, ජලයේ ගුරුත්වය ඉහළ යයි ද, ස්වභාවිකව ජලයේ හැසිරෙන පක්ෂීන් එම ජලාශ කරා ගමන් නොකරයි ද, පරිසරයේ දැඩි වියළි බවක් දෘශ්‍යමාන වේද, යන මෙම ලක්ෂණ ද වසංගත ඇතිවීමට ආසන්න බව දැක්වෙන පරිසර සාධක බව චරක සඳහන් කරයි.[11] විවිධ දේශවල හෝ රටවල වායුව ධූමාකාර වේද, එය ද වසංගත ඇතිවන බවට පෙර නිමිත්තකි. නිරන්තරයෙන් විවිධ වර්ණ වලින් යුතු වලාකුළු චන්ද්‍රයා හා තාරකාවන් වසාගෙන සිටී ද, නිරන්තරයෙන් විශාල භයංකර ශබ්ද ඇතිවේද මෙම ලක්ෂණ ද වසංගත පෙරනිමිති බව සෑම මතයයි.[12] වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රධාන නගර ආශ්‍රිතව වායු දර්ශක මාපකයන් යහපත් දත්ත ලබා නොදෙන බව පරිසරවේදීන් හා පරිසරය පිළිබඳ විද්‍යාඥයින් පෙන්වා දී තිබේ.

ආයුර්වේද මතානුකූලව නිරන්තරයෙන් අඳුරු ස්වභාවයෙන් යුක්ත වූ පරිසරය සහිත, සෑම විටම ජලයෙන් හෝ වලාකුළුවලින් වැසුනු ඉර, හඳ සහ තාරකා සහිත වූද, ස්වභාවික ව්‍යසන බහුල වූ දේශය වසංගත බහුලව ඇති විය හැකි දේශයන් වශයෙන් හඳුන්වා දී තිබේ. එසේ ම ස්වභාවික ඍතු විපර්යාසවලට අනුකූල නොවූ කාලය බොහෝ විට ජනපද හෝ ගෝලීය වසංගත ඇති කිරීමට හේතු වේ.[13]

**වසංගත මැඩ හෙලීමට සුදුසු විධි ක්‍රමෝපාය**[14]

1. **සුදුසු කාලයන් හි දී නෙලා ගත් ඖෂධ වර්ග වෛද්‍ය විධිවිධාන අනුව සේවනය කිරීම.**

සුදුසු කාලයේ නෙලාගත් ඖෂධවල රස, ගුණ, වීර්ය විපාක හා විචෘත ප්‍රශස්ත මට්ටමක හෝ ඊට වැඩි පරාසයක පැවතීම නිසා රෝග වැළැක්වීම හෝ රෝග සුවවීම වඩා සාර්ථකව සිදු වේ. ඖෂධ නෙලීමට, රැස් කිරීමට සහ ගබඩා කිරීමට සුදුසු කාල, ඍතු හා නැකැත් පිළිබඳව ආයුර්වේද ද්‍රව්‍යගුණ විඥාන විෂය තුළ මැනවින් විග්‍රහ කර තිබේ. නිශ්චිත කාලයේදී රැස් කර නොගන්නා ඖෂධවල ගුණ හීනවීම මෙයට ප්‍රධාන හේතුව බව ආර්ෂය මතයයි. සුදුසු කාලවලදී නෙලා ගෙන රැස් කර තබා ගන්නා ඖෂධ වසංගත කාලවලදී සුදුසු පරිදි වෛද්‍ය උපදෙස් මත භාවිත කිරීමෙන් වසංගත රෝග වලින් මිදීමට මනුෂ්‍යයාට හැකිවෙයි. එසේම වසංගත රෝග සමයේදී මිනිසාට වැළඳෙන රෝග සඳහා ප්‍රතිකාර කිරීමට ඖෂධ සකස් කර තබා ගැනීම වෛද්‍යවරයාගේ මූලික වගකීමක් ලෙස ආයුර්වේදය හඳුනා ගෙන තිබේ.

2. **සුදුසු පංචකර්ම සේවනය.**

පංචකර්ම චිකිත්සා යනු ආයුර්වේදයේ කාය චිකිත්සාවට අයත් චිකිත්සා විධියකි. විවිධ ඍතුවලට අනුකූලව ශරීරයේ දෝෂ අසමතුලිතතා ඇති වන හෙයින් ඒ ඒ ඍතුවලට අනුකූල ශෝධන කර්ම පංච කර්ම විධි යටතේ දක්වා තිබේ. ඒ අනුව වසංගත රෝග සඳහා හේතුවන කාරණාවන්ට ශරීරය මැඩ හෙලීමට අවකාශ නොසැලසීම පංච කර්ම විධි අනුගමනය කිරීමෙන් සිදු වේ.

පංච කර්ම විධි සේවනය නිසා දූෂිත වූ දෝෂයන් ශරීරයෙන් ඉවත් වීමෙන් රෝග නිදානයන් සඳහා සුදුසු පරිසරයක් ශරීරය තුළ ඇතිවීම නිරායාසයෙන්ම වැළකේ. පංච කර්ම යෙදීම තුළින් ස්‍රෝතස් වලට කාවැදී ඇති දෝෂ ශරීරයෙන් පහසුවෙන් ඉවත් වීම සිදු වේ.

3. **රසායන ප්‍රයෝගය.**

දූෂිත දෝෂ ඉවත් වීම නිසා ශරීර අභ්‍යන්තර පරිසරය රෝග සෑදීම වැළැක්වීමට උචිත ලෙස ගැඩ ගැසේ. එම නිසා මෙමඟින් රෝග ඇති වීම වැළැක්වීම නිරායාසයෙන්ම සිදුවනු ඇත. රසායන ප්‍රයෝගය පිළිබඳ විස්තර ඇතුළත් වන්නේ අෂ්ටාංග ආයුර්වේදයේ සඳහන් වන රසායන තන්ත්‍රයේය. රසායන ඖෂධ විධි ලෙස ප්‍රයෝග කිරීම තුළින් ශරීරයේ ඉන්ද්‍රියන් ජරාවට පත්වීම ප්‍රමාද කරයි. එමඟින් තාරුණ්‍ය රකිමින් චිරාත් කාලයක් ජීවත්වීමට අවකාශ හිමි වේ. තාරුණ්‍ය යනු රෝගවලට ඔරොත්තු දීමේ බලය ප්‍රශස්තව පවතින අවධියයි. මෙමගින් කොරෝනා වැනි වසංගත රෝගවලට ගොදුරුවීමේ අවස්ථාව අවම කර ගැනීමට අවස්ථාව උදාවෙයි. ආයුර්වේද ශාස්ත්‍රයේ සඳහන් ආචාර්ය රසායනය පිළිපැදීමට ද තාරුණ්‍ය රැක ගනිමින් ආයුෂ වර්ධනය කර ගැනීමට සුදුසු ක්‍රම උපායකි. මෙහිදී රසායන ඖෂධ භාවිතය සිදු නොවන අතර මානසික සෞඛ්‍ය යහපත්ව තබා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට ඇවැසි උපදෙස් ලබා දී තිබේ.

4. **සත්‍ය පරායණය.**

සත්‍ය පරායණය යනු සත්‍ය ප්‍රකාශ කිරීම හා ඒ අනුව ජීවත්වීමයි. සත්‍ය ප්‍රකාශ කිරීම හා ඒ අනුව

පිවත්වීමයි. සත්‍ය ප්‍රකාශ කිරීම ආයුර්වේදයේ සඳහන් ආචාර රසායන ක්‍රම වලට අයත් වූවකි. මෙවැනි මානසික ක්‍රියා දියුණු කිරීමෙන් රසායන චිකිත්සා සිදු කිරීමෙන් ලැබෙන ඵලයට සමාන වූ ඵලයක් මිනිසාට උරුම වේ.

**5. ප්‍රාණීන් කෙරෙහි දයාව කරුණාව දැක්වීම**

ප්‍රාණීන් කෙරෙහි දයාව කරුණාව දැක්වීම සිදුවන්නේ මනස මූලික කර ගෙනයි. ශරීරයේ මෙන්ම මනසේ පවිත්‍රතාව හා නිරවුල්භාවය ද රෝග වැළැක්වීමට හා වැළඳෙන රෝග ඉතා පහසුවෙන් සුවකිරීමට හේතු වේ. ඒ අනුව ප්‍රාණීන් කෙරෙහි දයාව දැක්වීම සම්පූර්ණයෙන්ම මනෝමය ක්‍රියාවකි. මෙහිදී මනස පවිත්‍රව පවතින අතර මනෝමය ප්‍රතික්‍රියා තුලින් ශරීරයේ හෝමෝන සමතුලිතතාව රැකීම සිදුවන අතර ඒ තුලින් ශරීරයේ ප්‍රතිශක්තිකරණය ඉහළ නැංවේ. එමඟින් රෝගවලින් ආරක්ෂාවීම නිරායාසයෙන්ම සිදු වේ.

**6. දානය**

දන්දීම ආදී ක්‍රියාවලින් මනස පිරිසිදු වන අතර තෘෂ්ණාව දුරුවීම සිදු වේ. මෙය ආචාර රසායන විධියකි. ඖෂධ භාවිතා නොකොට මිනිසාගේ තාරුණ්‍ය රැකගැනීමට මෙමගින් හැකිවන බව ආයුර්වේද මතයයි.

**7. පූජෝපහාර.**

පූජෝපහාර තුලින්ද මනස මූලිකව සිදුවන ක්‍රියා දාමයක් ශරීර අභ්‍යන්තරයේ සිදුවන අතර පවිත්‍ර හා සන්සුන් වූ මනස තුළ ජනිතවන ප්‍රීතිය මඟින් ශරීර ප්‍රතිශක්තිය ඉහළ නැංවේ. මෙය රෝගවලින් ආරක්ෂාවීමට වක්‍රාකාරව බලපෑම් ඇති කරයි.

**8. දෙවියන් පිදීම**

දෙවියන්, බුදුන් වහන්සේ ආදී ආගමික ශාස්තෘවරුන් කෙරෙහි පුද පූජා පැවැත්වීම ආදිය සිදු කිරීමෙන් මනස සන්සුන්ව ස්වස්ථතාව ආරක්ෂා වේ.

**9. සද්වෘත්තය අනුව හැසිරීම.**

දෙමාපිය, ගුරුවරු, පැවිදි උතුමන් කෙරෙහි භක්තිය හා සමාචාර දැක්වීම ආදී ක්‍රියාද, සත්‍යවාදී වීම, තෘෂ්ණාව, භය, ක්‍රෝධය වැනි ක්ලේශ දුරු කිරීම ද මෙහිදී වැදගත් වේ.

**10. ඉන්ද්‍රිය දමනය.**

ඉන්ද්‍රියන් දමනය කිරීම යන්වෙන් අදහස් වන්නේ චක්ෂු, ශෝත්‍ර, ඝ්‍රාණ, රසන, ස්පර්ශන හා මනස යන ෂඩ් ඉන්ද්‍රියන් පාලනය කිරීමයි. මෙමඟින් ඉන්ද්‍රියන් දුර්වල වීම හා බෝ නොවන රෝග මෙන්ම ප්‍රතිශක්තිය හීනවීමෙන් වැළඳෙන රෝග ද පහසුවෙන් වළක්වා ගැනීමට හැකි වෙයි.

**11. බ්‍රහ්මචාර්‍ය්‍ය හා බ්‍රහ්මචාරීන් සේවනය**

බ්‍රහ්ම චර්යා රැකීමෙන් ලිංගික ක්‍රියා කෙරෙහි ලෝලීත්වය නිසා ඇතිවන රෝග වැළැකීම සිදුවන අතර ඒ තුලින් වක්‍රාකාරව ශුක්‍රධාතුව ආරක්ෂා වීම නිසා රෝගවලින් තොරව යහපත් ජීවිතයක් ගත කිරීමට මනුෂ්‍යයාට අවකාශ ලැබෙයි.

**12. ධර්ම ශාස්ත්‍ර සේවනය.**[9]

එසේම ඉහතින් සඳහන් කළ වාතය, ජලය, දේශය හා කාලය විගුණතාවයට පත්වීමට ප්‍රධානතම කාරණය වශයෙන් සැළකෙන්නේ මිනිසා ධාර්මික ජීවිතයෙන් ඈත්වීමයි.[10] [15]

**චිකිත්සා සිද්ධාන්ත**

වසංගත රෝග හමුවේ ප්‍රතිකාර සඳහා යොමු වීම සිදු කළ යුත්තේ කෙසේ ද යන්න ආයුර්වේද වෛද්‍යවරයා මුහුණ පාන ප්‍රධාන අභියෝගයයි.

(01) බහුල වශයෙන් බටහිර වෛද්‍ය විද්‍යාවේ මෙන් ම ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ද රෝගය නාමිකව හඳුනාගෙන ප්‍රතිකාර ආරම්භ කිරීම මෙයින් ප්‍රධාන හේතුවයි. Covid 19 වසංගතය ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට මෙන්ම බටහිර වෛද්‍ය විද්‍යාවට ද නව රෝගයකි. බටහිර වෛද්‍ය විද්‍යාව රෝග නාමකරණය මෙන්ම රෝග හේතුවට අනුව සාර්ථක ප්‍රතිකාර පද්ධතීන් අත්හදා බලමින් සිටී. ආයුර්වේද චිකිත්සාවේ දී මේ සඳහා අතික්‍රාන්තා වේක්ෂණය යොදා ගැනීම ඉතා වැදගත් වෙයි.

(අතික්‍රාන්තාවේක්ෂණය යනු යම්කිසි විෂයක් පිළිබඳව මීට පෙර ග්‍රන්ථවල සඳහන් වූ කරුණු සොයා බැලීම හෝ නැවත අවලෝකනය කිරීමයි. එසේම මෙවැනි රෝග තත්වයන් ඇති වීම, ඒ සඳහා පුරාණ වෛද්‍යවරු ගත් ක්‍රියාමාර්ග ආදිය පිළිබඳව විමර්ශනය කිරීම අතික්‍රාන්තාවේක්ෂණය ලෙස සැලකිය හැකියි.)

(02) නාමිකව සඳහන් නොවන සහ නමක් ලබාදීමට අපහසු රෝග අවස්ථාවල දී ආයුර්වේද වෛද්‍යවරයා කටයුතු කළ යුතු ආකාරය පහත සඳහන් වෙයි.[16]

ශානාරූපෛරසංඛෙයයෛර්විකාරෛ:
කුපිතා මලාඃ
තාපයන්ති තනුං
තස්මාත්තද්ධෙත්වාකෘති සාධනම්

මේ අනුව රෝග සංඛ්‍යාව නම් කළ නොහැකිය. මේ සියල්ල ඇතිවන්නේ කෝප තත්ත්වයට පත් වූ දෝෂ අනුවයි. දෝෂ කෝපවීමේ තත්ත්වයන් විවිධාකර වෙයි. මේ අනුව වැළඳිය හැකි රෝග ප්‍රමාණයට නම් ලබා දීම අතිශය දුෂ්කර කරුණක් බව ආයුර්වේදය පෙන්වා දෙයි. එබැවින් රෝගයකට නම් ලබා දීමට නොහැකි වීම ලැජ්ජාවට පත්වීමට කරුණක් නොවන බව දක්වනු ලැබේ. මේ අනුව Covid 19 රෝගයේ දී ද කුපිත වූ දෝෂ තත්ත්වය නිරීක්ෂණය කර වෛද්‍යවරයා ඒ අනුව ප්‍රතිකාර ආරම්භ කළ යුතුයි.

(03) විකාර නාමාකුශලෝ න පිහ්‍රියාත් කදාවන
නහි සර්ව විකාරාණාම් නාමතෝ 'ස්ථි දෘවා ස්ථිති [17]

ඉහත චරක සංහිතාවේ සඳහන් ශ්ලෝකයෙන් දැක්වෙන්නේ ද රෝග නාමකරණයට සෑම විට ම උත්සාහ නො කළ යුතු බවයි. ඒ මන්ද යත් සියලු ම රෝගවලට නම් ලබා දීමට හැකියාවක් නොමැති බැවිනි.

(04) නාස්ති රොගො විනා
දොෂෛර්යස්මාත්තස්මාද් විචක්ෂණඃ
අනුක්තමපි දෝෂාණාං ලිංගෛර්ව්‍යාධි
මුපාචරේත් [18]

මෙහි දැක්වෙන කරුණු අනුව ද දෝෂයන්ගෙන් තොරව රෝගයක් උත්පාදනය නොවන බව පැහැදිලියි. දෝෂයන් පිළිබඳ ව හා ඒවායේ ලක්ෂණ අනුව ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරයා බුද්ධිමත් විය යුතුයි. මෙයින් අප විසින් ගත යුතු නිගමනය නම් Covid 19 රෝගයට ද ආයුර්වේද වෛද්‍යවරුන් ප්‍රතිකාර කළ යුත්තේ එම සිද්ධාන්තය පාදක කර ගෙන බවයි.

(05) Covid 19 රෝගයේ දී සුලභ ව හමුවන රූප වන්නේ ජ්වර, කාස, ප්‍රතිශ්‍යාව හා ශ්වාස තත්වයන් ය. ජ්වර, කාස හා ශ්වාස ආමාශය සමුත්පන්න රෝග සේ සැලකේ. මෙම රෝගවල දී අග්නිමාන්ද්‍ය ප්‍රධාන ලක්ෂණයක් සේ චිකිත්සාවේ දී සලකනු ලැබේ. විශේෂයෙන් ජ්වර රෝගයේ දී 'බහිර්නිරස්‍ය කෝෂ්ඨාග්නි ජ්වරදාඃ ස්‍යුරයානුගාඃ' [19] සේ දක්වනු ලැබේ. එනම් ජ්වරයේ දී කෝෂ්ඨගත අග්නිය ආමාශයෙන් ඉවතට පැමිණේ. එබැවින් අග්නිය යථාවත් කරමින් අග්නි පූර්ව ප්‍රතිකාරය ආරම්භ කළ යුතුයි.

(06) කාස, ශ්වාස හා ප්‍රතිශ්‍යාවේදී ද අග්නි දූෂණය සිදු වේ. මේ අනුව අග්නි මූලික ප්‍රතිකාරය චිකිත්සා සිද්ධාන්තයකි.

(07) ලාක්ෂණික ප්‍රතිකාර පද්ධතියට අනුගත වෙමින් කාස, ශ්වාස හා ජ්වර ආදී රෝග සඳහා සුදුසු ප්‍රතිකාර විධි අවස්ථානුකූල ව භාවිත කිරීම මෙහිදී සිදු කිරීම සුදුසු වේ.

(08) Covid 19 වෛරසයේ හැසිරීම මත මෙම රෝගීන් අතිසාර ලක්ෂණ ද පෙන්නුම් කරයි. එවැනි රෝගීන්ට අතිසාර රෝගානුසාරීව ප්‍රතිකාර ආරම්භ කිරීම සුදුසු වේ.

මේ අනුව Covid 19 වසංගතය සඳහා ප්‍රතිකාර කිරීමට මෙම සිද්ධාන්ත මත පිහිටා කටයුතු කිරීම සුදුසුයි.

**නිගමනය**

වසංගත රෝග ඉතිහාසය අවුරුදු 1000 - 3000 ක් පමණ පැරණිය. වසංගත රෝග පැතිරීම බොහෝ දුරට ආරම්භ වූ බවට සාක්ෂි සැපයෙන්නේ යුරෝපා රටවලිනි. විධිමත් ශිෂ්ඨාචාරයක් හා යහපැවැත්මක් සහිත රටවලින් වසංගත ඇතිවූ බවට ලැබෙන සාක්ෂි අල්පය. විශාල යුද්ධ ආදියෙන් පසුව වසංගත ඇතිවූ බවට සාක්ෂි හමුවේ. බොහෝවිට ස්වාභාව ධර්මයට විශාල වශයෙන් හානි සිදු වූ කල්හි වසංගත ඇති වී ඇති බව නිරීක්ෂණය වේ. ආයුර්වේදයේ සඳහන් වන පරිදි කායිකව හා මානසිකව ශක්තිමත් හා සමතුලිත පුද්ගලයාට රෝග ඇතිවීමේ ප්‍රවණතාවය ඉතා අල්ප වේ. රසායන විධි සේවනය, ආචාර රසායනය පිළිපැදීම ආදිය මඟින් රෝග ඇතිවීම වැළැක්වීමට උචිත පරිසරය මෙන්ම ප්‍රතිශක්තිය වර්ධනය වීම ද සිදුවන බව මෙයින් නිගමනය කළ හැකිය.

විමර්ශන.

1. Anderson W. History of Epidemiology, International Journal of Epidemiology, volume 48, issue 3,2018;11: 672 - 674 https://doi.org/10.1093/ije/dyy247
2. එම
3. අග්නිවේශ, චරක, දෘඪබල, චරක සංහිතා, විමාන ස්ථාන, ජනපදෝධ්වංස, අධ්‍යාය, 3/19, වාරාණසී, 009;242.
4. Anderson W. History of Epidemiology, International Journal of Epidemiology, volume 48, issue 3,2018;11: 672-674 https://doi.org/10.1093/ije/dyy247
5. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/5, 2009;242.
6. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/6, 2009;242.
7. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/6-1, 2009;242.
8. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/6(4), 2009;242.
9. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/6(4),2009;242.
10 එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/6(4),2009;242.
11. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/12-16,2009;244.
12. එම, චරක සංහිතාව, විමාන ස්ථානය අධ්‍යාය, 3/19
13. ශ්‍රීමත් වාග්භට අෂ්ඨාංගහෘදය සංහිතා, සූත්‍ර ස්ථාන, දෝෂභේදනීය අධ්‍යාය, 12/30-31, සංස්කාරක වෛද්‍ය හරි සදාශිවා ශාස්ත්‍රී ප්‍රදාකර, පළමු සංස්කරණය චොකම්බා සුරභාරති ප්‍රකාශන, වාරාණසී, 2010;197
14. අග්නිවේශ, චරක, දෘඪබල, චරක සංහිතා, සූත්‍ර ස්ථාන, ජනපදෝධ්වංස, අධ්‍යාය, 18/44, සංස්කාරක ආචාර්ය වෛද්‍ය යාද්වජි ත්‍රිකම්ජි පළමු සංස්කරණය චොකම්බා සංස්කෘත, වාරාණසී, 2009;108.
15. සුශ්‍රැත සංහිතා, සූත්‍ර ස්ථාන, ආතුරෝපක්‍රමණිය අධ්‍යාය, 35/19, සංස්කාරක ආචාර්ය වෛද්‍ය යාද්වජි ත්‍රිකම්ජි පළමු සංස්කරණය චොකම්බා සංස්කෘත, වාරාණසී, 2008;153.
16. ශ්‍රී මාධවකර, මාධව නිදානය, ජ්වර නිදානය, 2. සංස්කාරක වෛද්‍ය හිමසාගර චන්ද්‍රමූර්ති, පළමු සංස්කරණය, චොකම්බා සංස්කෘත වාරාණසී, 2009;29